# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2278/24 – 2022 මැයි මස 06 වැනි සිකුරාදා – 2022.05.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මාගේ යොමු අංකය: VE/DS/LA/AQ/WS/218.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2018/WS/218.

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ යාපනය - කිලිනොච්චි පානීය ජල සැපයුම් යෝජනා ක්‍රමය යටතේ වේලනෙයි ප්‍රාදේශීය කාර්යාලය සහ ගබඩා ඉදිකිරීම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට රජය අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශ්‍යතාවේ විස්තර:*

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, දිවයින දකුණ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, වේලනෙයි ඊසාන ජේ/13 ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, වේලනෙයි නැගෙනහිර ගමේ පිහිටි මූලික පිඹුර අංක පීපීයා 2992 හි පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.1478 ක් වූ නොච්චිකාඩු නමැති ඉඩම් කොටස:

කැබලි අංක 01
ඉඩමේ නම: නොච්චිකාඩු; ඉඩමේ විස්තරය: අවු. 10-35 අතර වයස ඇති තල් ගස් 02ක් වත්තේ පිහිටා ඇත; හිමිකම් කියන අය: මුත්තුලිංකම් විමලේන්දිරන් මහතා සහ බිරිඳ රාජේස්වරි මිය.; ප්‍රමාණය: හෙක්. 0.1478.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022.07.11 වැනි දින පෙරවරු 10.00 ට දිවයින දකුණ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2022.06.24 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුයි.

කේ. සිවකරන්,
ප්‍රාදේශීය ලේකම්,
දිවයින දකුණ,
වේලනෙයි.

2022 අප්‍රේල් මස 27 වැනි දින,
දිවයින දකුණ වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 05 – 0002